5 . 04 . 2016

ද මැසනොද් විදුහල, කඳාන

**De Mazenod College – Kandana**

# තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය I

දෙවන වාර පරීක්ෂණය 2016 — 12 ශ්‍රේණිය

පැය දෙකයි

Learning Resource Center
Kandana

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1. “A , B ට වෙනස්ය ” යන ප්‍රකාශනය
   1. සමමිතික සම්බන්ධතාවයකින් යුතුය
   2. අසමමිතික සම්බන්ධතාවයකින් යුතුය
   3. නොසමමිතික සම්බන්ධතාවයකින් යුතුය
   4. සංක්‍රාන්තික සම්බන්ධතාවයකින් යුතුය
   5. අසංක්‍රාන්තික සම්බන්ධතාවයකින් යුතුය

2. තෝමස් කුන් ජිවත් වූ කාලය වන්නේ
   1. 1561 - 1626
   2. 1901 - 1985
   3. 1902 - 1994
   4. 1905 - 1997
   5. 1922 - 1996

3. ඇගයුම්ශිලි විද්‍යාවකි
   1. පුරා විද්‍යාව
   2. ඉතිහාසය
   3. අචාර ධර්මය
   4. තර්ක ශාස්ත්‍රය
   5. දේවධර්ම වාදය

4. විද්‍යාත්මක මාතයක ලක්ෂණය ගැන කාල් පොපර්ගේ මතය අනුව පහත කුමන ප්‍රකාශනය විද්‍යාත්මක ද?
   1. එක්කෝ පේරාදෙණියට වහී නැත්නම් නොවසී
   2. දෙවියන් වහන්සේ ලෝකය මැවූ සේක
   3. බලු කුක්කා බලු පැටවෙකි
   4. ඇය සෙම්ප්‍රතිශ්‍යාවෙන් පෙළෙයි
   5. කේන්ද්‍රරය අනුව නම් ඕස්ට්‍රේලියාවේ රැකියාවක් ලැබීමට පුළුවන

5. පදයක වස්තු අර්ථය හා ගුණාර්ථය අතර ඇති නිවැරදි සම්බන්ධය වන්නේ
   1. පදයක වස්තු අර්ථය හා ගුණාර්ථය සමානව විචලනයවේ
   2. පදයක වස්තු අර්ථය අඩුවන විට ගුණාර්ථය අඩුවේ
   3. පදයක වස්තු අර්ථය වැඩිවන විට ගුණාර්ථය වැඩිවේ
   4. හැම පදකයම වස්තු අර්ථය හා ගුණාර්ථය ප්‍රතිලෝම අනුපාතිකව විචලනය වේ
   5. හැම පදයකම වස්තු අර්ථය හා ගුණාර්ථය ප්‍රතිලෝම අනුපාතිකව විචලනය නොවේ

6. විශ්ලේෂි අසත්‍ය ප්‍රස්තුතය වන්නේ මින් කුමක්ද?
   1. වඳ ස්ත්‍රීන්ට දරුවන් නැත
   2. ත්‍රිකෝණයක කෝණ තුනකි
   3. යාපනය ශ්‍රී ලංකාවේ අගනුවරය
   4. දෙකයි දෙකයි පහයි
   5. වැස්සොත් පොළොව තෙමෙන්නේ නැත

ද මැසනොද් විදුහල, කඳාන
De Mazenod College – Kandana
# තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය I

දෙවන වාර පරීක්ෂණය 2016 — 12 ශ්‍රේණිය

පැය දෙකයි

7. සියලු විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ රැවුල වවති
විමර්ශනශීලි චින්තකයින් විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ වෙති
එම නිසා විමර්ශනශීලි චින්තකයින් රැවුල වවති
ඉහත තර්කය අයත්වන සංවාක්‍ය ප්‍රකාරය වන්නේ
1. තුන්වන ප්‍රකාරය
2. හතරවන ප්‍රකාරය
3. දෙවන ප්‍රකාරය
4. පළමු ප්‍රකාරය
5. එකකටවත් අයත් නොවේ

8. විද්‍යාත්මක ක්‍රමය පිළිබඳ වඩා නිවැරදි අර්ථකථනය වන්නේ මින් කුමක්ද?
1. ප්‍රැන්සිස් බේකන්ගේ නිර්වචනයයි
2. විද්‍යාඥයා පරීක්ෂණ පැවැත්වීමයි
3. විද්‍යාවේ අසත්‍යකරණ තර්කයයි
4. උද්ගමනවාදීන්ගේ අර්ථකථනයයි
5. විද්‍යාවේ උපන්‍යාස සමර්ථනය කිරීමේ තර්කයයි

9. කිසියම් පද යුගලයක් මගින් කථා විශ්වය මුළුමනින්ම නිරවශේෂ නොකරන පද
1. විසංවාදි පදය
2. ප්‍රත්‍යනික පදය
3. සංයුක්ත පදය
4. වියුක්ත පදය
5. සාපේක්ෂ පදය

10. (a). අනුභූතික පරීක්ෂණයන්ට භාජනය කිරීම
(b). උපන්‍යාස ගොඩනැගීම
(c). ගැටලුව අර්ථකථනය කිරීම
(d). නිගාමී අනාවැකි ලබා ගැනීම
(e). උපන්‍යාස පිළිගැනීම බහිෂ්කරණය හෝ සංශෝධනය
විද්‍යාත්මක ක්‍රමයේ පියවර අනුක්‍රමය දක්වා ඇත්තේ
1. cbdea
2. cbdae
3. bcdae
4. cbeda
5. cdbae

11. පර්යාප්ත හේතු මූලධර්මය ඉදිරිපත් කරනු ලැබුවේ
1. ඇරිස්ටෝටලිය
2. සොක්‍රටීස්ය
3. ප්‍රැන්සිස් බේකන්ය
4. බර්ට්‍රන් රසල්ය
5. ලයිබ්නිට්ස්ය

12. පහත දැක්වෙන ප්‍රකාශන අතරින් සාවද්‍ය ප්‍රකාශය වන්නේ
1. මිනිසා යන්න සමාන්‍ය පදයකි
2. සුදු - කළු යනු ප්‍රත්‍යනික පද යුගලයකි
3. සම්ප්‍රදායික තර්ක ශාස්ත්‍රයේ චින්තන නියම තුනකි
4. ඇඳුම ඇතැම් විට තාර්කික පදයක් විය හැකිය
5. අන්ධ, ගොළු, බිහිරි යනු වෛකල්‍යවාචි පදයන්ය

දෙ මැසනොද් විදුහල, කඳාන

**De Mazenod College – Kandana**

# තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය I

දෙවන වාර පරීක්ෂණය 2016 | 12 ශ්‍රේණිය

පැය දෙකයි

13. සමහර තර්ක ශාස්ත්‍රඥයෝ ගණිතඥයෝ වෙති ගණිතඥයින් බුද්ධිමතුන් වන හෙයිනි
ඉහත සඳහන් ලුප්ත සාංවාක්‍යයේ ලොප් වී ඇති ප්‍රස්තුතය මින් කුමක්ද?
1. සියලු තර්ක ශාස්ත්‍රඥයෝ බුද්ධිමතුන් වෙති
2. තර්ක ශාස්ත්‍රඥයින් බුද්ධිමතුන් නොවෙති
3. සියලු බුද්ධිමතුන් තර්ක ශාස්ත්‍රඥයින් වෙති
4. සමහර බුද්ධිමතුන් තර්ක ශාස්ත්‍රඥයික් නොවෙති
5. සමහර බුද්ධිමතුන් තර්ක ශාස්ත්‍රඥයින් වෙති

14. "පේරාදෙණියේ කරණවෑමියා තමා විසින් තමාගේ රැවුල බා නොගන්නා සියලු දෙනාගේම හා ඔවුන්ගේ පමණක් රැවුල බායි" ඔහු තමාගේ රැවුල බා ගනිද?
මෙම ප්‍රකාශය තුල ඇත්තේ
1. අයථා පරිවර්තන ආභාසයයි
2. අයථා ප්‍රතිවර්තන ආභාසයයි
3. සංදිග්ධතා ආභාසයයි
4. අව්‍යාප්ත මාධ්‍ය පද ආභාසයයි
5. විරුද්ධාභාසයයි

15. ව්‍යවහරික විද්‍යාවක් නොවන්නේ
1. භූ ගර්භ විද්‍යාව
2. අපරාධ වෛද්‍ය විද්‍යාව
3. ගෘහ නිර්මාණ ශිල්පය
4. පාරිසරික විද්‍යාව
5. මනෝ චිකිස්සාව

16. තාරකා විද්‍යාවේ අද්විතිය නිරික්ෂකයෙකි
1. හර්ෂල්
2. කොපර්නිකස්
3. ටයිකෝ ද බ්‍රාහී
4. කෙප්ලර්
5. ගැලිලියෝ ගැලීලි

17. " විද්‍යාවේ ස්ථාවර නිරීක්ෂණ වාක්‍ය නොමැත " යයි විශ්වාස කල විධික්‍රමය ලෙය සැලකෙන්නේ
1. පර්යේෂණ වැඩසටහන් ක්‍රමය
2. සාපේක්ෂක වාදය
3. උද්ගමන වාදය
4. නිගාමී සත්‍යක්ෂණවාදය
5. නිගාමී අසත්‍යකරණවාදය

18. " සියලු වෙළෙන්දන් කපටි නැත " යන ප්‍රස්තුතය මගින් ලබා ගැනෙන සප්‍රමාණ ආනයන වර්ගය මින් කුමක්ද?
1. සමහර වෙළෙන්දන් නොවන අය කපටිය
2. සමහර කපටි අය වෙළෙන්දන් නොවෙති
3. කපටි නොවන සමහර අය වෙළෙන්දන් වෙති
4. සමහර වෙළෙන්දන් කපටි නොවන්නෝ නොවෙති
5. සමහර කපටි අය වෙළෙන්දන් වෙති

19) පහත රූප සටහනට අදාල නිවැරදි සංකේතකරණය කුමක්ද?



1. $A\bar{B} = \phi$ $x \in \bar{A}B$
2. $A\bar{B} \neq \phi$ $x \in A\bar{B}$
3. $A\bar{B} = \phi$ $x \notin A$
4. $A\bar{B} = \phi$ $x \notin B$
5. $\bar{A}B$ $x \notin B$

20) " ඩෙංගු රෝගීන් කිපදෙනෙකුට අසාධ්‍යයයි " යන්න ඔබට දී ඇත්නම් වෙන්රූප සටහන් අනුව ගම්‍ය කරගත හැකි සප්‍රමාණ නිගමනය මින් කුමක්ද?

1. ඩෙංගු රෝගීන් නොවන අසාධය අය සිටි
2. අසාධ්‍ය නොවන ඩෙංගු රෝගීන් සිටි
3. ඩෙංගු රෝගීන්ට අසාධ්‍යයයි
4. ඩෙංගු රෝගීන්ට අසාධ්‍ය නැත
5. අසාධ්‍ය ඩෙංගු රෝගීන් සිටි

21) විධික්‍රමවාදියාගේ කාර්යය වන්නේ

1. විද්‍යාඥයාගේ ක්‍රමය පිරික්සීමය
2. සම්භාවිතා සහිත නිගමනයන්ට එළඹීමය
3. සම්පරීක්ෂණයේ යෙදීමය
4. හොඳ උපන්‍යාස ගොඩනැගීමය
5. තෝමස් කුන්ගේ ක්‍රමය භාවිතා කිරීමය

22) නිරීක්ෂණයේ අත්‍යවශ්‍ය ලක්ෂණ විය යුත්තේ

1. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය භාවිතා කිරීමය
2. උපකරණ භාවිතා කිරීමය
3. ප්‍රපංචයේ සාධක විචලනය නොකිරීමය
4. උපන්‍යාස පදනම් වීමය
5. සත්‍ය නිගමනයන්ට එළඹීමය

23) ගුරුත්වාකර්ෂණවාදයේ අනාවැකියක් නොවන්නේ මින් කුමක්ද?

1. සූර්ය ග්‍රහ මණ්ඩලයක් වශයෙන් පැවතීම
2. වඩදිය බාදිය ඇතිවීම
3. පෘථිවිය මතට වස්තූන් නිදැල්ලේ පතිත වීම
4. සූර්යා වැනි වස්තුවක් අසලින් එන අලෝක ධාරාව එම වස්තුව දෙසට නැමී ගමන් කළ යුතු බව
5. වෙඩි උණ්ඩයක ප්‍රක්ෂිප්තය පැරබෝලාවක ස්වරූපය ගැනීම

ද මැසනොද් විදුහල, කඳාන

**De Mazenod College – Kandana**

# තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය I

දෙවන වාර පරීක්ෂණය 2016 | 12 ශ්‍රේණිය

පැය දෙකයි

24. '' විද්‍යාවේ විධික්‍රමය පිළිබඳ අරාජිකවාදි දෘෂ්ටියක් හෙලමින් විධික්‍රමය වශයෙන් කුමන හෝ දෙයක් කළ හැකි අතර විධික්‍රමය පිළිබඳ නිශ්චිත ක්‍රියාමාර්ග නැතැයි '' යන්න ප්‍රකාශ කරනු ලැබුවේ
   1. කාල් පොපර්ය
   2. රසල් හැන්සන්ය
   3. පෝල් පයරබන්ඩ්ය
   4. තෝමස් කුන්ය
   5. ඉම්රි ලකටෝස්ය

25. අනිරීක්ෂණය යනු
   1. ඉන්ද්‍රිය දත්ත වරදවා දැකීමයි
   2. නිරීක්ෂණය නොකිරීමයි
   3. නිරීක්ෂණය කළ යුතු කරුණු මග හැරීමයි
   4. සම්පරීක්ෂණයට පෙර පරීක්ෂණයයි
   5. උපකරණ භාවිතා නොකර කරන පරීක්ෂණයයි

26. පොපර්ගේ අසත්‍යකරණීයතාවය පිළිබඳ රීතිය අදාල වන්නේ
   1. අනුභූතික පරීක්ෂණයට භාජනය කළ හැකි ප්‍රකාශනයන්ටය
   2. අනුභූතික නොවන විද්‍යාවන්ටය
   3. සෞන්දර්ය විද්‍යාවන්ටය
   4. භාෂා ශාස්ත්‍රයන්ටය
   5. බුද්ධිය පදනම් කොට ගෙන ගොඩනැගු විද්‍යාවන්ටය

27. ඇන්ටන් ලැවොසියර් ඉදිරිපත් කළ දහනය පිළිබඳ ඔක්සිකරණවාදය මගින් ඉදිරිපත් කළේ යමක් දැවෙන්නට
   1. ප්ලොජිස්ටන් අවශ්‍ය බවයි
   2. ඔක්සිජන් අවශ්‍ය බවයි
   3. හයිඩ්‍රජන් වායුව අවශ්‍ය බවයි
   4. නයිට්‍රජන් වායුව අවශ්‍ය බවයි
   5. කාබන්ඩයොක්සයිඩ් වායුව අවශ්‍ය බවයි

28. '' ගලපටලයට හේතුවන පීවාණු පිටකරණ විෂ ද්‍රව්‍යයක් ඇත''. යන ලොෆ්ලර්ගේ මතය පරීක්ෂා කිරීමට එමිල් රූ සිතට ගත්තේය '' මෙය අදාල වන්නේ උපන්‍යාසයක්
   1. අවශ්‍ය සත්‍යයක් වියයුතුය
   2. ස්වයං විරෝධී නොවිය යුතුය
   3. සංදිග්ධතාවයෙන් යුක්ත නොවිය යුතුය
   4. සරල එකක් විය යුතුය
   5. ගම්‍යයන් ලබා ගත හැකි විය යුතුය

29. සමාන්‍යකරණයෙන් අනාවැකිය කරා යන්නේ ........................................ ය හිස්තැනට සුදුසු වචනය
   1. උද්ගාමී විධික්‍රමවාදියා
   2. නිගාමී විධික්‍රමවාදියා
   3. සාපේක්ෂකවාදියා
   4. විද්‍යාඥයා
   5. ශාස්ත්‍රඥයා

දෙ මැසනොද් විදුහල, කඳාන

**De Mazenod College – Kandana**

# තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය I

දෙවන වාර පරීක්ෂණය 2016

12 ශ්‍රේණිය

පැය දෙකයි

30. විද්‍යාවේ යොදා ගැනෙන ප්‍රධාන අනුභූතික පරීක්ෂණ ලෙස සලකනු ලබන්නේ මින් කුමක්ද?
    1. නිරීක්ෂණය හා නිර්ණාය පරීක්ෂණය
    2. සම්පරීක්ෂණය හා නිර්ණාය පරීක්ෂණය
    3. නිරීක්ෂණය හා පරමාදර්ශී පරීක්ෂණය
    4. සම්පරීක්ෂණය හා පරමාදර්ශී පරීක්ෂණය
    5. නිරීක්ෂණය හා සම්පරීක්ෂණය

31. පොල් ෆයරබාන්ඩ් විසින් රචනා කළ ග්‍රන්ථයන් වන්නේ
    1. විධික්‍රමයට එරෙහිව, නිදහස, සමාජ විද්‍යාව, ගැඹුරු මුහුද
    2. ඕර්ගනම්, නිදහස, සමාජ විද්‍යාව, ගැඹුරු මුහුද
    3. තර්ක බුද්ධියට අයුබෝවන්, විධික්‍රමයට එරෙහිව, නිදහස, ආකාශ ගෝලයන්ගේ පරිභ්‍රමණය
    4. විධික්‍රමයට එරෙහිව, තර්ක බුද්ධියට අයුබෝවන්, නිදහස, සමාජ විද්‍යාව
    5. ඕර්ගනම්, නියෝ ඕර්ගනම්, ගැඹුරු මුහුද, නිදහස

32. '' සියලු මල් ලස්සන නැත'' යන ප්‍රස්තුතයේ වාච්‍ය හා වාචක පදයන්ගේ ව්‍යාප්තිය පිළිබඳ නිවැරදි පිළිතුර කුමක්ද?
    1. අව්‍යාප්තයි, ව්‍යාප්තයි
    2. අව්‍යාප්තයි, අව්‍යාප්තයි
    3. ව්‍යාප්තයි, ව්‍යාප්තයි
    4. ව්‍යාප්තයි, අව්‍යාප්තයි
    5. පද ව්‍යාප්තිය නිශ්චය කළ නොහැකිය

33. එක් සත්‍යතාවයක් කෙරෙන් වෙනත් සත්‍යතාවක් ගම්‍ය කර ගැනීම කුමන මූලික ලක්ෂණයක්ද?
    1. නිගාමී අනුමානය
    2. උද්ගාමී අනුමානය
    3. අනුමානය
    4. ව්‍යවහිත අනුමානය
    5. අව්‍යවහිත අනුමානය

34. යම් තර්කයක සප්‍රමාණතාව රඳා පවතින්නේ,
    1. ප්‍රස්තුත වල අර්ථය මතය
    2. ප්‍රස්තුත වල සත්‍යතාවය මතය
    3. ප්‍රස්තුත වල අර්ථය හා සත්‍යතාවය මතය
    4. නිගමනයේ නිවැරදි බව මතය
    5. තර්කයේ රූපය මතය

35. '' මව්වරු සියලු දෙනා රටහැර යන්නේ නැත '' යන්නට අදාල නිවැරදි සංකේතකරණය වන්නේ
    1. $AB = O$
    2. $AB \neq O$
    3. $A\bar{B} \neq O$
    4. $A\bar{B} = O$
    5. $\bar{A}B \neq O$

36. ප්‍රතියෝග චතුරාශ්‍රයට අනුව E ප්‍රස්තුතය අසත්‍ය වන විට පිළිවෙළින් A, I හා O ප්‍රස්තුත වල භාවිත ඇගයුම් වන්නේ පිළිවෙළින්
    1. අසත්‍ය, අසත්‍ය, සත්‍ය
    2. අවිනිශ්චිතයි, අසත්‍ය, සත්‍ය
    3. අසත්‍ය, සත්‍ය, අසත්‍ය
    4. අවිනිශ්චිතයි, සත්‍ය, අසත්‍ය
    5. අවිනිශ්චිතයි, සත්‍ය, අවිනිශ්චිතයි

37. සමහර ළමයින් අවංක නැත යන්නෙහි පරස්ථානපනය වන්නේ
1. සමහර අවංක අය ළමයින් නොවේ
2. සමහර ළමයින් වංකය
3. සමහර වංක අය ළමයින් නොවේ
4. සමහර වංක අය ළමයින්ය
5. සමහර අවංක නොවන අය ළමයින් නොවන්නේ නොවේ

38. සංවාක්‍යයක නිගමනය විශේෂ ප්‍රස්තුතයක් වූ විට ඇතිවිය නොහැකි ආභාසයක් වන්නේ
1. අයථා සාධ්‍ය පද අභාසයයි
2. අයථා පක්ෂ පද අභාසයයි
3. අව්‍යාප්ත මධ්‍ය පද අභාසයයි
4. චතුස්පද අභාසයයි
5. ද්විපද අභාසයයි

39. BRAMANTIP ( බ්‍රමන්ටිප් ) යන උපප්‍රකාරය
1. පළමු ප්‍රකාරයට අයත්ය
2. හතරවන ප්‍රකාරයට අයත්ය
3. දෙවන ප්‍රකාරයට අයත්ය
4. තුන්වන ප්‍රකාරයට අයත්ය
5. මින් එකකටවත් අයත් නැත

40. A ≠ O
B ≠ O යන්නට අදාල රූප සටහන වන්නේ



1. 2. 3. 4. 5.

41. පාඩම් කළොත් විභාගය සමත් වේ
පාඩම් කරයි
එහෙයින් විභාගය සමත් වේ
ඉහත තර්කය අයත් වන්නේ
1. මිශ්‍ර සෝපාධිකයටය
2. මිශ්‍ර වියෝජකයටය
3. අමිශ්‍ර සෝපාධිකයටය
4. අමිශ්‍ර වියෝජකයටය
5. ශුද්ධ නිරුපාධිකයටය

42.

| (a) | (b) | (c) | (d) | (e) |
|---|---|---|---|---|
| A PM | I MP | E MP | A PM | O MP |
| A SM | I MS | A SM | A MS | E SM |
| A SP | I SP | E SP | I SP | O SP |

1. be
2. bd
3. de
4. ab
5. bc

43) " කිසිම මලක් පියකරු නැත " යන ප්‍රස්තුතය යූලර්ගේ වෙන්රූප සටහන් අනුව අදාල රූප සටහන වන්නේ



1. 2. 3. 4. 5.

44) විද්‍යාවේ උපන්‍යාස බහිෂ්කරණය කිරීමේ තර්කය
1. විද්‍යාත්මක ක්‍රමයේ යොදා ගත නොහැකිය
2. නිගාමී සත්‍යෙක්ෂණවාදීන් යොදා ගනී
3. නිගාමී අසත්‍යකරණවාදීන් යොදා ගනී
4. නිගාමී තර්කයක් වශයෙන් නිශ්ප්‍රමාණය
5. උද්ගාමී විධික්‍රමවාදීන් යොදාගනී

45) සමාජ විද්‍යාව යනු
1. මිනිසා හා භෞතික වස්තූන් අතර සම්බන්ධතාව පිළිබඳ හැදෑරීමයි
2. ස්වභාව ධර්මය හා සජීවී වස්තූන් පිළිබඳ හැදෑරෙන විද්‍යාවන්ය
3. මිනිසා පදනම් කොටගත් සමාජීය ලක්ෂණ පිළිබඳ හැදෑරෙන විද්‍යාවන්ය
4. දැනුම වර්ධනය කර ගැනීමේ අරමුණින් ගොඩ නැගුණු විද්‍යාවන්ය
5. යම්කිසි දෙයක පැවැත්ම හෝ නොපැවැත්ම පිළිබඳ කෙරෙන විද්‍යාවන්ය

46) ස්වභාවික විද්‍යාවක් මෙන්ම සමාජ විද්‍යාවක් ලෙසද හඳුන්වනු ලබන විද්‍යාවක් මින් කුමක්ද?
1. දේශපාලන විද්‍යාව
2. අධ්‍යාත්මක විද්‍යාව
3. තාරකා විද්‍යාව
4. මානව විද්‍යාව
5. මනෝ විද්‍යාව

47) ගැලිලියෝ ගැලිලි
1. ඕස්ට්‍රියානු ජාතිකයෙකි
2. ඉංග්‍රීසි ජාතිකයෙකි
3. ඉතාලි ජාතිකයෙකි
4. ඇමෙරිකානු ජාතිකයෙකි
5. ජර්මන් ජාතිකයෙකි

48) ලලින් ශෙහාන්ට වඩා වයසින් වැඩි වුවද නිවාන්ටත් රශේන්ටත් වඩා බාලය අභිෂේක් ලලින්ට වඩා වයසින් වැඩිය වයසින් වැඩිම පුද්ගලයා අභිෂේක් නොවේ මේ අයගෙන් බාලම තැනැත්තා කවුද?
1. ලලින්
2. ශෙහාන්
3. නිවාන්
4. රශේන්
5. අභිෂේක්

ද මැසනොද් විදුහල, කඳාන
De Mazenod College – Kandana
# තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය I

දෙවන වාර පරීක්ෂණය 2016 — 12 ශ්‍රේණිය

පැය දෙකයි

49) ඉදින් A = ( 9, 7, 5, 1 ) හා B = ( 8, 7, 5, 2 ) නම් එවිට ( A U B ) වන්නේ
1. ( 5, 7 )
2. ( 2, 5, 6, 7, 8, 9 )
3. ( 1, 2, 3, 6, 8, 9 )
4. ( 1, 2, 5, 7, 8, 9 )
5. ( 1, 2, 8, 9 )

50) යුරේනස් ග්‍රහයා සොයා ගනු ලැබුවේ
1. ගැලිලියෝ ගැලිලි
2. විලියම් හර්ෂල්ය
3. කොපර්නිකස්
4. ඇඩම්ස් හා ලෙවියර්ය
5. ඇරිස්ටාකස්ය

5-04-2016

Learning Resource Center
R
De Mazenod College
Kandana

ද මැසනොද් විදුහල, කඳාන

**De Mazenod College – Kandana**

# තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය II

දෙවන වාර පරීක්ෂණය 2016 | 12 ශ්‍රේණිය | පැය තුනයි

(I, II යන කොටස් දෙකෙන් එක් කොටසකින් ප්‍රශ්න 4 බැගින් තෝරා ගෙන ප්‍රශ්න 8 කට පමණක් පිළිතුරු සපයන්න )

## I කොටස

1) පහත දැක්වෙන සංවාක්‍ය සප්‍රමාණද, නිෂ්ප්‍රමාණදැයි නිර්ණය කරන්න සංවාක්‍ය නිෂ්ප්‍රමාණ වන විට බිඳි ඇති රීතිය / රීති හා සිදුවී ඇති ආභාස / ආභාසය ද නම් කරන්න

1. සමහර ග්‍රීකයින් දාර්ශනිකයින් නොවේ
සමහර දාර්ශනිකයින් නිරෝගිය
එහෙයින් සමහර ග්‍රීකයින් නිරෝගිය

2. ළමයින් පමණක් අවංක වන අතර අවංක අය පමණක් විභාග සමත් වන හෙයින් ළමයින් පමණක් විභාග සමත් වෙයි

3. X හංසයෙකි
X සුදුපාටයි
එහෙයින් හංසයින් සුදුපාටයි

4. සියලු බුද්ධිමතෙක්වත් උගතෙක් වත් ධර්මිෂ්ඨ නොවන හෙයින් කිසිම උගතෙක් බුද්ධිමතෙක් නොවේ

(ලකුණු 10)

2)

1. ආනුභූතික පරීක්ෂණය යනු කුමක්ද? ප්‍රධාන ආනුභූතික පරීක්ෂණ කොටස් දෙක සඳහන් කර ඒවා උදාහරණයක් බැගින් දෙමින් පැහැදිලි කරන්න (ලකුණු 06)
2. ඉහත දැක්වූ පරීක්ෂණ වර්ග දෙකෙහි ඇති වෙනස්කම් මොනවාද? (ලකුණු 04)

3)

1. 
   - I. සියලු සිසුන් දක්ෂය යන ප්‍රස්තුතයේ පරස්ථාපන පියවර අනුක්‍රමයෙන් ලියා දක්වමින් ලබා ගන්න
   - II. කිසිම මලක් ලස්සන නැත යන ප්‍රස්තුයේ ප්‍රතිවර්තය පරස්ථාපන පියවර අනුක්‍රමයෙන් ලියා දක්වමින් ලබා ගන්න

(ලකුණු 05)

2. සුදුසු නිදසුනක් ගෙනහැර දක්වමින් සද්භාවය පිළිබඳ ආභාසය ( පැවැත්ම පිළිබඳ ආභාසය ) යනු කුමක්දැයි සම්ප්‍රදායික ප්‍රතියෝග චතුරස්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න (ලකුණු 05)

4) නිගාමී සතේක්ෂණවාදී විධික්‍රමය යනු කුමක්දැයි දක්වා එය විවේචනාත්මකව විභාග කරන්න (ලකුණු 10)

5)

1. නිගමනය සර්වවාචී ප්‍රස්තුතයක් නොවුවහොත් අයථා පක්ෂ පද ආභාසය ගට නොගැනිමට ඇති හේතුව පැහැදිලි කරන්න (ලකුණු 04)
2. පහත සඳහන් ඒවායින් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් හඳුන්වා දි ඒ එකකට එක් උදාහරණයක් බැගින් දෙන්න
   - I. මිශ්‍ර සෝපාධික සංවාක්‍යයක්
   - II. මිශ්‍ර වියෝජක සංවාක්‍යයක්
   - III. ශුද්ධ සෝපාධික සංවාක්‍යයක්

(ලකුණු 06)

II කොටස

6) යටත් පිරිසෙයින් එක් කොටසකට උදාහරණ දෙකක්වත් දෙමින් පහත සඳහන් ඒවා පැහැදිලිව විස්තර කරන්න

1. ප්‍රමාණික විද්‍යා
2. ශුද්ධ විද්‍යා
3. ව්‍යවහාරික විද්‍යා
4. රූපික විද්‍යා
5. ආනුභවික විද්‍යා

(ල 3 x 5 = 15)

7)

1. පහත සඳහන් තර්ක සංකේතයට නගා ඒවා සප්‍රමාණ වේද නිෂ්ප්‍රමාණ වේද යන්න වෙන්රූප සටහන් මගින් නිගමනය කරන්න

I. සිංහයා මාංශභක්ෂිකයෙකි
සියලු මාංශභක්ෂිකයින් කැලයේ වෙසෙති
එහෙයින් සිංහයා කැලයේ වෙසෙයි

II. සමහර සිසුන් දක්ෂය කිසිම දක්ෂයෙක් තමන්ගේ කාලය අපතේ යවන්නේ නැත එහෙයින් කාලය අපතේ යවන කිසිවෙක් සිසුවෙක් නොවේ

III. සමහර මල් සුවඳයි
සමහර මල් පියකරුයි
එහෙයින් සමහර මල් සුවඳ මෙන්ම පියකරුයි

(ල 3 x 3 = 09)

2. '' පලතුරු සමහරක් පැණිරස නැත'' යන්න සත්‍ය නම් පහත දැක්වෙන අනුමාන සප්‍රමාණද? නැත්නම් නිෂ්ප්‍රමාණද? යන්න වෙන්රූප සටහන් උපයෝගි කරගෙන පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු දෙන්න

I. පළතුරු තිබේ
II. පැණි රස දේ ඇත
III. පැණිරස නොවන එහෙයින් පළතුරු වන දේ ඇත
IV. පැණිරස සමහරක් පලතුරු නොවේ
V. පළතුරු පමණක් පැණිරසයි
VI. සමහර පළතුරු පැණිරසයි

(ල 1 x 6 = 06)

8) පහත දැක්වෙන දෑ අතර පවත්නා වෙනස්කම් දක්වන්න

1. අනිරීක්ෂණය සහ දුර්නිරීක්ෂණය
2. නිගාමී අනුමානය හා උද්ගාමී අනුමානය
3. ඍජු හා වක්‍ර පරීක්ෂණය

(ල 5 x 3 = 15)

9)

1. පහත සඳහන් සංවාක්‍ය උපප්‍රකාර සුදුසු නිදසුනක් සහිතව හඳුන්වා දෙන්න

I. සෙසරෙ (CESARE)
II. කැමෙස්ට්‍රෙස් ( CAMESTRES )
III. ෆෙස්ටිනෝ ( FESTINO )
IV. බරෝකෝ (BAROCO )

(ලකුණු 08)

2. විශේෂ සාධ්‍ය අවයවයකින් හා ප්‍රතිශේධාත්මක පක්ෂ අවයවයකින් සප්‍රමාන නිගමනයක් ලබා ගත නොහැක්කේ මන්දැයි සංවාක්‍ය පිළිබඳ ප්‍රධාන රීතින් ඇසුරෙන් පැහැදිලි කරන්න (ලකුණු 07)

10)

1. සහභාගි නිරීක්ෂණයකින් සැලසෙන වාසි සහ අවාසි මොනවාද? (ලකුණු 05)
2. නිරීක්ෂණ භාෂාවේ වාදභාරිත බව පිළිබඳව ලුහුඩින් පැහැදිලි කරන්න (ලකුණු 05)
3. කාල් පොපර්ගේ අසත්‍යකරණවාදි විධි ක්‍රමයෙහි නිගාමී සප්‍රමාණතාවය පිළිබඳව සටහනක් ලියන්න (ලකුණු 05)